# දාබිඳු

පුවත්පතක් වශයෙන් ලියාපදිංචි කර ඇත

ආරම්භය 1984

39 වන කාණ්ඩය | 03 වන කලාපය | 2023 ජනවාරි කලාපය

# මානව හිමිකම් දිනය



**සෑම** වසරකම දෙසැම්බර් මස 10 වන දින ලෝක මානව හිමිකම් දිනය ලෙස සලකනු ලබයි. 1948 දෙසැම්බර් මස 10 වන දින මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්වීය ප්‍රකාශනය සම්මත කරගැනීමෙන් පසු සෑම වසරකම මානව හිමිකම් දිනය සමරනු ලබයි. එහි මෙවර (2022) තේමාව වන්නේ සැමට අභිමානය, නිදහස සහ යුක්තිය යන්නයි.

මිනිසුන් වීම නිසා ලැබෙන්නා වූ අයිතිවාසිකම් මානව හිමිකම් යනුවෙන් හැඳින්විය හැකිය. මේවා සිවිල්, දේශපාලනික, ආර්ථික හා සංස්කෘතික වශයෙන් දැක්විය හැකිය. මානව හිමිකම් යනු විශ්වීය අයිතිවාසිකම් ය. මෙයින් අදහස් කරන්නේ ඔවුන් කවුරුන් වුවද, සෑම කෙනෙකුටම සමානව හා ගෞරවයෙන් සැලකිය යුතු බවයි. මිනිසුන් ස්ත්‍රී පුරුෂ භාවය, ජාතිය, ඔවුන්ගේ සමේ වර්ණය, ලිංගික දිශානතිය, ආගම, සහ ඔවුන් ඉපදුණු රට ආදී හේතු නිසා වෙනස් කොට සැලකීම නොකළ යුතුය.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසන් සභාව මඟින් අපේ රට තුළ මූලික අයිතිවාසිකම් ඒවා කඩ කිරීම සම්බන්ධව කටයුතු කරනු ලබයි. 1996 වර්ෂයේ දී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසන්

8 වන පිටුවට...

**ඇතුළු පිටු**


| | |
|---|---|
| **03 පිටුව** - නීති දැනුම | **08 පිටුව** - මානව හිමිකම් දිනය |
| **04 පිටුව** - මිනිස් ජාවාරම් දිනය | **09 පිටුව** - විදෙස් පුවත් / සුව සහ රුව |
| **05 පිටුව** - ලිංගික හිංසනය | **10 පිටුව** - සිතුවිල්ල / ප්‍රහේලිකාව |
| **06 - 07 පිටුව** - අපේ වැඩ | **11 පිටුව** - ජාත්‍යන්තර අධ්‍යාපන දිනය |

## ඩාබිඳු සාමුහිකය

221, වෙළඹඩ පාර, කටුනායක
දුර : 011 4 851 383
ඊ. මේල් : dabindu.infoco@gmail.com
Facebook : dabindu collective sri lanka
Web : www.dabinducollective


# පුරවැසි අයිතීන් තහවුරු කර ගැනීමට තීරණාත්මකව මැදිහත් වෙමු

රටේ ජනතාවගේ ජීවත් වීමේ නිදහස පවතින ආර්ථික අර්බුධය හමුවේ උල්ලංඝනය කර ඇති අවස්ථාවක රාජ්‍ය ධනය අව භාවිතය කරමින් මහජන විරෝධය නොතකා පැවැත්වූ 75වන නිදහස් උත්සවය පටු අරමුණු ඉටුකර ගැනීමට කළ උත්සහයකි.

ජනතාවගේ මූලික අවශ්‍යතාවයන් ලබා දීමට නොහැකි පාලකයන් පසුගිය වසර 75 තුළම වංචාව, දූෂණය කොමිස් තුළින් ඔවුන්ගේ බලය රඳවා පවත්වා ගැනීමට ගත් වෙහෙස නිසා රටක් ලෙස සංවර්ධනයක් කරා යොමු වීමක් දක්නට නොලැබුණි. අකාර්යක්ෂම, අසාර්ථක පාලකයින් නිසා මේවන විට ලංකාවේ ආහාර අනාරක්ෂිත භාවයට 36%ක් ලක්ව ඇතිබව ලෝක ආහාර වැඩසටහනේ තත්ව වාර්තාව පෙන්වා දේ. එසේම UNICEF සංඛ්‍යා ලේඛණවලින් ද අවුරුදු 5ට අඩු ළමුන් 56000ක් උග්‍ර මන්දපෝෂණයෙන් පෙළෙන බවද පෙන්වා දේ. ආර්ථික අර්බුදය නිසා ලංකාවේ 2023 වසරේ ජනවාරි මස ආහාර උද්ධමනය 69.8%වන බවද පෙන්වා දෙයි. මේවන විට ලංකාවේ මුළු රාජ්‍ය විදේශ ණය ප්‍රමාණය ඇ.ඩො. බිලියන 50ක් පමණ වේ. එයින් 40% පුද්ගල ව්‍යාපාරවලින් ගත් ණය වන අතර මේ ණය පියවීමට සෘජු හා වක්‍ර බදු ලෙස පුරවැසියාට ගෙවීමට සිදු වී ඇත.

ණය බරින්, ජීවන බරින් පීඩිත වූ ජනතාවට නිදහස සැමරීමට, ආඩම්බර වීමට හැකි, ගෞරවාන්විත පුරවැසියන් ලෙස ජීවත් වීමට වාතාවරණයක් අපිට උරුම වී ඇත්ද. ඒ පිළිබඳ කථා කිරීමට, පෙනී සිටීමට අයිතිය ඇත්ද? මර්ධනයෙන්, සිරගත කිරීමෙන් පුරවැසියාගේ කට වසා ඒකාධිපති බලය තහවුරු කරගැනීමට හැකි සෑම උත්සහයක්ම ගන්නා පාර්ශවයන්ට අවංකව සැමරිය හැකි නිදහසක් කෝ.

මේවන විට කර්මාන්ත ශාලා වසා දමමින්, මූලික වැටුප් පමණක් ගෙවමින්, වසර කිහිපයකින් වැටුප් වර්ධකයක් නොකරමින්, කම්කරු නීති වෙනස් කරමින් කම්කරුවෝ තවත් වලපල්ලට ඇද දමමින් ශ්‍රමය සූරා කෑම උපරිමයට සිදු කරන පාලකයන්ට එරෙහිව නැගී සිටීමට කම්කරුවන්ට ශක්තිය ප්‍රාර්ථනා කරන අතරම ඒ සඳහා අත්වැල් බැඳ ගන්නා ලෙස ඉල්ලා සිටිමු.

# නිදහස් සෞඛ්‍ය?



බංකොලොත්භාවයේ හිනිපෙත්තටම පැමිණි ශ්‍රී ලංකාව තවදුරටත් පහතට වැටීමට හේතු වන්නේ ආඩම්බරකාර දේශපාලකයින්ගේ පුහු ඵලදායි නොවන අදූරදර්ශී තීරණ හේතුවෙනි. දිනෙන් දින ලක්වාසි ජනතාව ආර්ථික අර්බුදයෙන් මිරිකී බඳු බර කර දරාගෙන මන්දපෝෂණයේ අංක එකටම යමින් සිටී. නිදහස් සෞඛ්‍යයේ ප්‍රතිලාභ ලැබූ ලංකාවාසීන්ට අද සිදුව ඇත්තේ බෙහෙත් හිඟය හමුවේ අත්‍යවශ්‍යම බෙහෙත් හෝ නැතුව පණ අදින්නටය. රට තුළ ලියාපදිංචි කළ අත්‍යවශ්‍ය ඖෂධ වර්ග 300න් ඖෂධ වර්ග 150කටත් වඩා සංඛ්‍යාවක් මේ වන විටත් රට තුල නොමැත. අද වන විට නිර්වින්දන ඖෂධ හිඟයට මුහුණ පෑමට සිදු වී ඇති නිසා අත්‍යවශ්‍ය ශල්‍යකර්මද සිදු කිරීමට නොහැකිව වෛද්‍යවරුන් දැඩි පීඩනයකට පත්ව සිටී. තවමත් බොරු පුරාජේරුකමින් කල්ගෙවන පිටරටින් සෞඛ්‍ය සේවාව ලබන දේශපාලකයෝ අහිංසක මහජනතාවගේ නිදහස් සෞඛ්‍ය අයිතියද උදුරා ගනිමින් සිටිති.

යසාරා විදුමිණි




# නීති දැනුම

## 1954 අංක 19 දරණ සාප්පු හා කාර්යාලයීය සේවකයින් පිළිබඳ පනත

1954.08.04 වන දින සිට ක්‍රියාත්මක වන සාප්පු හා කාර්යාලයීය සේවකයින් පිළිබඳ පනත ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ආර්ථික හා සංස්කෘතික අයිතීන් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියට අනුව ක්‍රියාත්මක වේ. මෙම පනතේ සාප්පු හා කාර්යාලයීය සේවයේ නියුතු සේවිකාවන් සඳහා ප්‍රසූතිකාධාර පහසුකම් සම්පාදනයේදී ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ 103 වන ප්‍රසූතිකාධාර පිළිබඳ සම්මුතිය පදනම් කරගෙන ඇත.

මෙම පනතේ අරමුණු වන්නේ සාප්පු හා කාර්යාලවල සේවයේ යෙදී සිටින සේවකයන්ට සේවා පහසුකම් සැලසීම, සේවා කාලයන් නියම කිරීම, අතිකාල දීමනා සහ නිවාඩු පිළිබඳ විධිවිධාන පැනවීම, වේතන පිළිබඳ නීතිරීති ක්‍රියාත්මක කිරීම, හා මෙම පනතින් ආවරණය වන සේවිකාවන්ට ප්‍රසූතිකාධාර පහසුකම් සැලසීම යි. මේ හරහා ලංකාවේ තිබෙන සියලුම සාප්පු හෝ කාර්යාලවල සේවය කරන සියලුම සේවකයින් ආවරණය වේ.

මෙම ලිපිය හරහා පණත යටතේ හිමිවිය යුතු ප්‍රසූත නිවාඩු පිළිබඳව කරුණු ඉදිරිපත් කරනු ලැබේ.

## ප්‍රසූත නිවාඩු

**මෙහිදී ඔබට හිමිවිය යුතු ප්‍රසූත නිවාඩු පහත පරිදි වේ.**

- සජීවි දරු උපතක් සඳහා පූර්ණ පාරිශ්‍රමික සහිත දින 84ක නිවාඩු හිමි වේ. එයින් දින 14ක් ප්‍රසූතියට පෙර ලබාගත හැකි අතර ඉතිරි දින 70 ප්‍රසූතියට පසු ලබාගත හැකිය. ප්‍රසූතියට පෙර නිවාඩු දින 14 හෝ ඉන් කිහිපයක් ලබා නොගත් අවස්ථාවක දින 70ට පසුව එම ඉතිරි නිවාඩු ලබාගත හැකිය.
- සජීවී දරුවෙකු බිහි නොවුනහොත් (අජීවී දරු උපතක් සඳහා) පූර්ණ පාරිශ්‍රමික සහිත දින 42ක නිවාඩු හිමිවේ. එයින් දින 14ක් ප්‍රසූතියට පෙර ලබාගත හැකිය. ඉතිරි දින 28 ප්‍රසූතියට පසු ලබාගත හැකිය. ප්‍රසූතියට පෙර නිවාඩු දින 14 හෝ ඉන් කිහිපයක් ලබා නොගත් අවස්ථාවක දින 28ට පසුව එම ඉතිරි නිවාඩු ලබාගත හැකිය.
- අජීවී දරු උපතකදී පහත සඳහන් කොන්දේසි සම්පූර්ණ නොකරන්නේ නම් එම සේවිකාව ප්‍රසූතිකාධාර හෝ ප්‍රසූත නිවාඩු සඳහා හිමිකම් නොලබයි.
- අවම වශයෙන් කළලය සති 28ක් වයස්ගත විය යුතුය.
- යම් හෙයකින් සති 28 පිළිබඳව සැකයක් තිබේනම් කළලයේ දිග අවම වශයෙන් අඟල් 12ක් වත් විම හෝ කළලයේ බර අවම වශයෙන් රාත්තල් 02ක් වත් වීම යන කොන්දේසි දෙකෙන් එකක්වත් සම්පූර්ණ විය යුතුය.
- ප්‍රසූතිය ලෙස සජීවී හෝ අජීවි දරු උපතක් සලකනු ලබයි.
- පූර්ණ පාරිශ්‍රමික සහිත දින ගණන ගණන් ගැනීමේදී දිනයක හා දින භාගයක සති නිවාඩු ගණන පෝය නිවාඩු ගණන හා ප්‍රසිද්ධ නිවාඩු ගණන අතහැර වැඩ කරන දින 84 හෝ දින 42 ගණනය කළ යුතු වේ.

මූලාශ්‍රය - කම්කරු නීති අත්පොත
(කම්කරු දෙපාර්තමේන්තුව)



# මිනිස් ජාවාරම් දිනය

සෑම වසරකම මිනිස් ජාවාරම පිළිබඳ දැනුවත් කිරීමේ දිනය ජනවාරි 11 වන දිනට යෙදී ඇත. මෙම දිනය මිනිස් ජාවාරමට ගොදුරු වූවන්ගේ දුක්ඛිත තත්ත්වය පිළිබඳව දැනුවත් කිරීම මෙන්ම ඔවුන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම අරමුණු කරයි. මිනිස් ජාවාරම යනු බලයෙන්, වංචාවෙන් හෝ බලහත්කාරයෙන් ශ්‍රමය, ගෘහ සේවය හෝ වාණිජ ලිංගික ක්‍රියාකාරකම් සඳහා වෙනත් පුද්ගලයෙකු සූරාකෑමයි.

**මිනිස් ජාවාරම් විවිධ ආකාරයෙන් සිදු වේ. ඒවා පහත පරිදි දැක්විය හැකිය.**

- **බලහත්කාරයෙන් කම්කරුවන් සඳහා වෙළඳාම් කිරීම**
- **බලහත්කාර අපරාධ ක්‍රියාකාරකම් සඳහා ජාවාරම් කිරීම**
- **ලිංගික ජාවාරම**
- **අවයව ඉවත් කිරීම සඳහා ජාවාරම් කිරීම**
- **ගෘහ සේවය**

ලිංගික ජාවාරම යනු මිනිස් ජාවාරමේ වඩාත් සුලභ ආකාරය වන අතර මිනිස් ජාවාරමේ වැඩි වශයෙන් ගොදුරු වන්නේ කාන්තාවන් සහ ගැහැණු ළමයින් ය. 2020 දී සිදු කරන ලද පුද්ගලයන් ජාවාරම පිළිබඳ ගෝලීය වාර්තාවට අනුව, ගෝලීය වශයෙන්, මිනිස් ජාවාරමට ගොදුරු වන සෑම තිදෙනෙකුගෙන් එක් අයෙක්ම කුඩා දරුවෙක් වන අතර ප්‍රධාන වශයෙන් ඒ ගැහැණු දරුවෙක් වේ. ඔබ දන්නෙහි ද මෙසේ ජාවාරමට ලක් වූ කාන්තාවන් සහ ළමයින් සඳහා ගෘහාශ්‍රිත හෝ සේවා ක්ෂේත්‍රයේ රැකියාවක් ලබා දෙන බවට පොරොන්දු වී ඇති අතර ඔවුන්ව ඒ වෙනුවට ලිංගික ශ්‍රමිකයන් ලෙස ගණිකා මඩම් වෙත රැගෙන යන අතර ඔවුන්ගේ විදේශ ගමන් බලපත්‍ර සහ වෙනත් හඳුනාගැනීමේ පත්‍රද ජාවාරම් කරුවන් විසින් ගනු ලැබේ.

ශ්‍රී ලංකාව තුළ, ස්ත්‍රීන්, ළමයින්, වාර්ගික සුළුතරයන් සහ වැඩිහිටි පුද්ගලයින් බොහෝ විට අවදානමට ලක්වන පිරිස් වන අතර ජාවාරම්කරුවන් පිරිමින්, කාන්තාවන් සහ ළමයින් බලහත්කාරයෙන් ශ්‍රමිකයන් සහ ලිංගික ජාවාරම්වල යෙදවනු ලබයි. කොරෝනා වෛරසයේ බලපෑම, ආර්ථික අර්බුධය ආදී කරුණු මත වර්ථමානය වන විට ශ්‍රී ලංකාව තුළ මිනිස් ජාවාරම ඉහළ ගොස් ඇත. වර්ථමානයේදී ඇඟලුම් කම්හල් සේවිකාවන් විදේශ ගත වීමේ දැඩි ප්‍රවණතාවයක් ඇති වී ඇති අතර ඔවුන් විවිධ ජාවාරම්කරුවන්ගේ ගොදුර බවට පත් වී ඇත. එම නිසාම නිසි ක්‍රමවේද භාවිතා කරමින් නිසි තොරතුරු මත පදනම්ව ඔබ එම කටයුතු සඳහා යොමු විය යුතුය. ඔබ නිසි අවධානයෙන් නොසිටියහොත් මීළඟ ගොදුර ඔබ විය හැකිය.

**මධුමාලි සිරිවර්ධන**
(තොරතුරු අන්තර්ජාලය ඇසුරිනි)



# ලිංගික හිංසනය

ලිංගික හිංසනය යනු පුද්ගලයෙකුගේ අකමැත්තෙන් වචනයෙන් හෝ ක්‍රියාවෙන් ලිංගික අශිෂ්ට හැසිරීමක්, ලිංගික වර්ණ ප්‍රකාශයක්, අසභ්‍ය දර්ශන පෙන්වීමක් හෝ ලිංගික ඉල්ලීම් සිදු කිරීමකි. මෙම ලිංගික හිරිහැර වාචික, වාචික නොවන, ලිඛිත, භෞතික සහ දෘශ්‍ය ආකාරයෙන් සිදු විය හැක. පුද්ගලයෙකුගේ ඇඳුම් පැළඳුම්, පෞද්ගලික හැසිරීම් හෝ ශරීරය පිළිබඳ, ලිංගික ස්වභාවය පිළිබඳව, ලිංගික අසභ්‍ය ප්‍රකාශ, ප්‍රශ්න, විහිළු හෝ කතාන්දර සහ පුද්ගලයෙකුගේ පෞද්ගලික හෝ ලිංගික ජීවිතය පිළිබඳ කටකතා පතුරුවා හැරීම වාචික ආකාරයේ ලිංගික හිරිහැරයකට ඇතුළත් බව එහි සඳහන් වේ.

පුද්ගලයෙකුගේ ශරීරය ඉහළට සහ පහළට බැලීම. ලිංගික ස්වභාවයේ නින්දිත අභිනය, හිතාමතාම පුද්ගලයෙකුට සමීපව සිටීම වාචික නොවන ලිංගික හිරිහැරයට යටත් වේ. පුද්ගලයෙකුගේ ශාරීරික චලනයට බාධා කිරීම හෝ අවහිර කිරීම, පුද්ගලයෙකු නුසුදුසු හා අනවශ්‍ය ලෙස ස්පර්ශ කිරීම සහ සිපගැනීම, වැළඳ ගැනීම, තට්ටු කිරීම, පහර දීම ඇතුළු අනිකුත් නුසුදුසු ස්පර්ශයන් ශාරීරික ලිංගික හිරිහැරයක් ලෙස හැඳින්විය හැක. දෘශ්‍ය ලිංගික හිරිහැර සඳහා අදාල වනුයේ ලිංගික පින්තූර, පෝස්ටර්, දින දර්ශන, හෝ පරිගණක/ජංගම තිර ප්‍රදර්ශනය කිරීම සහ වෙනත් පුද්ගලයින්ට ලිංගික යෝජනා කරන කෙටි පණිවිඩ හෝ ඊමේල් යැවීම සහ අසභ්‍ය දර්ශන වැනි ලිංගිකව නුසුදුසු රූප හෝ වීඩියෝ බෙදා ගැනීම යනාදියයි.

රැකියා ස්ථානය තුළද ලිංගික හිංසනය සිදුවන අතර රැකියා ස්ථානය තුළ ලිංගික අතවරවලට ලක්වන කම්කරුවන් විශාල සංඛ්‍යාවක් සිටිති. රැකියා ස්ථානයේ ලිංගික හිංසනය යනු සේවා පරිසරයට සෘණාත්මකව බලපාන, රැකියාවේ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය අඩපණ කරන, රැකියාවේ අසාධාරණ භාවිතයන් ඇති කරන සහ කම්කරුවන්ගේ ගෞරවයට සහ යහපැවැත්මට අහිතකර ලෙස බලපාන ලිංගික වෙනස්කම් කිරීම වේ. එය වින්දිතයින් සඳහා මානසික කාංසාව සහ ආතතිය ඇති කරනු ලබයි. ඔබ ලිංගික අතවරයකට ගොදුරු වුවහොත් පහත සඳහන් ආයතන ඔබට සේවය සලසා දීමට කටයුතු කරනු ලබයි.

**කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය**

5 වන මහල, සෙත්සිරිපාය II,
බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
දුරකථන : +94 11 2186055
ෆැක්ස් : +94 11 2187249
විද්‍යුත් තැපෑල secycdwa@gmail.com

**ශ්‍රී ලංකා පරිගණක හදිසි සූදානම කණ්ඩායම (SLCERT)**
**WV2F+8F2, Colombo 00700**
**0112 691 692**
**cert@cert.gov.lk**

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව 1996**
**011 250 5575 / 077 308 8135 / 077 376 2112**
14, ආර්. ඒ. ද මැල් මාවත, කොළඹ 4.
**011 250 5580 / 011 250 5581 / 011 250 5582**
**sechrcsl@gmail.com**
**www.hrcsl.lk**

සස්කා සාජහන්



# කම්කරුවන් සවිබල ගැන්වීමේ දෙවැනි වැඩමුළුව

2023 නව වර්ෂයේ ඩාබිඳු සාමුහිකයේ ප්‍රථම වැඩසටහන ලෙස උතුරු ප්‍රදේශයේ දෙවන පෙළ නායකයින් 15 දෙනෙකු සම්බන්ධ කරගනිමින් පවත්වනු ලබන ඇඟළුම් සේවිකාවන් සවිබල ගැන්වීමේ වැඩසටහන් මාලාවේ දෙවන වැඩසටහන සාර්ථක ලෙස කිලිනොච්චි නගරයෙහි පවත්වන ලදි. 2023 ජනවාරි මස 7 සහ 8 යන දිනයන් හි පවත්වන ලද මෙම වැඩසටහනෙහි සම්පත් දායිකාව ලෙස නුවර මානව සංවර්ධන ආයතනයේ කේ. යෝගේෂ්වරී මහත්මිය සම්බන්ධ විය. මෙහිදී ඔවුන් මුහුණ දෙන ගැටළු, එම ගැටළු සඳහා විසඳුම්, කම්කරු අයිතිවාසිකම් මෙන්ම වෘත්තීය සමිතියක් පිහිටුවීම ආදී කරුණු පිළිබඳව දැනුවත් කරන ලදි. එහිදී ඔවුන් මුහුණ දෙන ගැටළු ලෙස පහත කරුණු ඉදිරිපත් විය.


- ආහාර ගැටළු
- වැසිකිලි පහසුකම් නොමැතිකම
- පානීය ජලය නොමැතිකම
- ප්‍රමාණවත් වැටුප් නොමැතිකම
- ප්‍රචණ්ඩ ක්‍රියා
- OT රිසිට්පත නොදීම
- නිවාඩු ලබා ගැනීමට ඉඩ නොදීම
- ප්‍රවාහන ගැටළුව - ප්‍රමාණවත් බස් ආසන පහසුකම් නොමැතිකම
- සෞඛ්‍ය පහසුකම් නොමැතිකම
- මානව සම්පත් කළමනාකරණ කණ්ඩායම කම්කරුවන්ගේ ගැටළු ගැන සලකා නොබැලීම
- මානව සම්පත් නිළධාරීන් විසින් OT කිරීමට බල කිරීම
- නිල ඇඳුම නොමැතිකම

# උතුරේ කම්කරුවන් සමඟ පැවති අවිධිමත් සාකච්ඡා

උතුරු පළාතේ කිලිනොච්චි සහ වව්නියා නගර පදනම් කරගනිමින් දෙසැම්බර් මස 18වන දින හා ජනවාරි මස 21වන දිනයන්හි දී එම ප්‍රදේශය තුළ ජීවත්වන ඇඟළුම් කර්මාන්තයේ නියුතු කම්කරුවන් සමඟ මෙම අවිධිමත් සාකච්ඡා අපගේ දෙවන පෙළ නායකන් විසින් සාර්ථක ලෙස සිදු කරනු ලැබීය. මෙහිදි වර්තමානයේ රටේ උද්ගත වී ඇති තත්වයත් සමඟ ඔවුන් මුහුණ දෙන අභියෝග, ගැටළු, සේවා ස්ථානයේ ඇති ගැටළු ආදිය පිළිබඳව සාකච්ඡා සිදු කරන ලදි.



# පොදු කුස්සිය







ඇඟළුම් ක්ෂේත්‍රයේ නියුතු සේවිකාවන්ගේ පෝෂණ ගැටළු විසඳීම අරමුණු කරගනිමින් පවත්වනු ලබන පොදු කුස්සිය මෙවරද සාර්ථක ලෙස පවත්වන ලදි. මේ වන විට ධාබිඳු සාමූහිකය විසින් 15කට වැඩි වාර සංඛ්‍යාවක් මෙම පොදු කුස්සිය සාර්ථකව පවත්වන ලැබීය. දෙසැම්බර් මස 3 වන දින සහ නව වර්ෂයේ ජනවාරි මස 8වන දින කටුනායක ආයෝජන කලාපය පදනම් කරගනිමින් ද දෙසැම්බර් මස 18වන දින බියගම





ආයෝජන කලාපය පදනම් කරගනිමින් ද ජනවාරි මස 15වන දින කටුනායක ආයෝජන කලාපය මෙන්ම බියගම ආයෝජන කලාපය පදනම් කරගනිමින් පවත්වන ලදි. එසේම ජනවාරි මස 22වන දින කිලිනොච්චිය සහ වව්නියා ප්‍රදේශ පදනම් කරගනිමින් ද ජනවාරි මස 28වන දින කටුනායක ආයෝජන කලාපය පදනම් කරගනිමින් ද මෙම වැඩසටහන පවත්වන ලදි. මෙහිදී දිවා ආහාර පාර්සල් 560කට අධික සංඛ්‍යාවක් බෙදා දෙන ලදි. මෙම වැඩසටහන් සඳහා දායකත්වය සපයන ලද්දේ Global Fund සංවිධානය මෙන්ම දේවී ලීෆර් මහත්මිය විසිනි.

# කණ්ඩායම් සාකච්ඡා

වෘත්තීය සමිතියක අවශ්‍යතා සහ අපේක්ෂාවන් හඳුනාගැනීම සඳහා ගම්පහ දිස්ත්‍රික්කයේ කර්මාන්ත ශාලාවල සේවකයන් 40 දෙනෙකු සමඟ ධාබිඳු සාමූහිකය විසින් සංවිධානය කරන ලද කණ්ඩායම් සාකච්ඡා වැඩසටහන 2022.12.21 වන දින බියගම තිළිණ හෝටලයේදී පැවැත්විණි. මෙම වැඩසටහන සඳහා සම්පත් දායකත්වය දෙන ලද්දේ කේසර කෝට්ටේගොඩ මහතා විසිනි. මෙහිදී මෙම සැසිය හරහා සේවක අවශ්‍යතා හඳුනා ගැනීමට අවස්ථාවක් ලබා දෙන ලදි. එසේම වෘත්තීය සමිතියක වැදගත්කම පහදා දුන් අතර නිදහස් වෙළඳ කලාපය පදනම් කරගත් වෘත්තීය සමිතියක් ගොඩනැගීමට සියළු දෙනා එකඟ විය. එසේම වෘත්තීය සමිතියක් ගොඩනැගීමේ අභියෝග සහ ඒවාට විසඳුම් පිළිබඳවද මෙහිදී සාකච්ඡා කරන ලදි.





1 පිටුවෙන්... **මානව හිමිකම් දිනය**

සභාව ස්ථාපිත කරන ලද අතර මේ ආයතනය හරහා දැනට සිදු කෙරෙන ප්‍රධාන සේවාවන් කිහිපයක් පහත පරිදි වේ.

- **මූලික මානව හිමිකම් උල්ලංඝනය වන අවස්ථාවල දී ඒ ගැන සොයා බැලීම.**
- **මූලික අයිතිවාසිකම් අනුව යමින් වෙනත් නීති සම්පාදනය කිරීම.**
- **රටේ නීති පද්ධතිය ජාත්‍යන්තරයේ පිළිගත් ක්‍රමවේදයන්ට අනුව සකස් කිරීම.**
- **මානව හිමිකම් පිළිබඳව රටේ ජනතාව දැනුවත් කිරීමේ විවිධ ක්‍රමවේදයන් ජනතාව අතරට ගෙන යෑම.**

එසේම මානව හිමිකම් කොමිසන් සභාවට අමතරව ශ්‍රී ලංකාව තුළ මානව අයිතිවාසිකම් සුරක්ෂිත කරන ආයතන ලෙසින් ශ්‍රේෂ්ඨාධිකරණය, නීති ආධාර කොමිසම, මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය, මානව අයිතිවාසිකම් පිළිබඳ නීතිවේදී සංවිධානය යනාදිය දැක්විය හැකිය.

තවද කාන්තා අයිතිවාසිකම් පිළිබඳ අවධානය යොමු කිරීමේ දී එක්සත් ජාතීන් විසින් 1979 දෙසැම්බර් 18 දින කාන්තාවන්ට එරෙහි ව සිදු වන සියලු ආකාරයේ වෙනස්කම් තුරන් කිරීම පිළිබඳ සම්මුතිය සම්මත කරගනු ලැබීය. මානව හිමිකම් භුක්ති විඳීමේ දී කාන්තාවන්ට එරෙහි ව සිදු වන සියලු ආකාරයේ වෙනස්කම් සමාජය තුළින් නැති කිරීම අරමුණ ඇතිව 1981 සැප්තැම්බර් 03 දින සිට මෙම සම්මුතිය ක්‍රියාත්මක කරනු ලැබීය. මෙම සම්මුතිය යටතේ කාන්තාවන්ට හිමි අයිතීන් කොටස් කිහිපයක් පහත පරිදි දැක්විය හැකිය.

- **කාන්තාවන්ගේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්**
- **පවුල් ඒකකය තුළ කාන්තාවන්ගේ අයිතිවාසිකම්**
- **අධ්‍යාපනයට හා පුහුණුවීමට ඇති අයිතිය**
- **ආර්ථික කටයුතු හා එහි ප්‍රතිලාභවලට ඇති අයිතිය**
- **සෞඛ්‍යාරක්ෂාවට හා පෝෂණයට ඇති අයිතිය**
- **සමාජ වෙනස්කම්වලින් ආරක්ෂා වීමේ අයිතිය**

## තවද මානව හිමිකම් පිළිබඳව පහත කරුණු දැන සිටීම ඔබට ඉතා වැදගත් වේ.

- **මිනිසුන්ගේ මූලික අවශ්‍යතා සපුරාලීම මානව හිමිකම් මඟින් සහතික කරයි**
- **ලෝකය පුරා දිවි ගෙවන අවදානමට ලක් වූ පුද්ගල කණ්ඩායම් අපයෝජනය වීමෙන් ආරක්ෂා කරයි**
- **මානව හිමිකම් මඟින් සමාජ දූෂණයට එරෙහිව නැගී සිටීමට මිනිසුන්ට ඉඩ සලසයි**
- **මානව හිමිකම්, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස දිරිගන්වයි**
- **මානව හිමිකම් මඟින් මිනිසුන්ට තම ආගම ඇදහීමේ හෝ කිසිදු ආගමක් අනුගමනය නොකිරීමේ නිදහස ලබා දේ**
- **මානව හිමිකම් මඟින් මිනිසුන්ට තමන් කැමති කෙනෙකුට ආදරය කිරීමට ඉඩ සලසයි**
- **මානව හිමිකම්, සැමටම සමාන ලෙස රැකියා අවස්ථා ලැබීම දිරිමත් කරයි**
- **මානව හිමිකම් මඟින් මිනිසුන්ට අධ්‍යාපනය සඳහා ප්‍රවේශය ලබා දේ**
- **මානව අයිතිවාසිකම් පොදු සම්මතයක් මඟින් රජයන් සිය වගකීම්වලට බැඳ තබයි**

මේ ආදී ලෙස මිනිසුන් වීම නිසා හිමිවන්නා වූ මානව හිමිකම් රැසකි. මෙහි දක්වා ඇත්තේ ඉන් කිහිපයක් පමණි. ඔබට හිමිවිය යුතු මානව හිමිකමක් කඩ වුවහොත් ඒ සඳහා නීතිමය පියවර ගත හැකිය.

**මධුමාලි සිරිවර්ධන**
(තොරතුරු අන්තර්ජාලය ඇසුරිනි)

# විදෙස් විත්ති

Clean Clothes Campaign (CCC) ජාලය මෙම වසරේ මානව හිමිකම් දිනය නිමිති කරගනිමින් "Living Wage" (ජීවන වැටුප) නමින් කෙටි චිත්‍රපටයක් නිර්මාණය කර ඇත. ඇඟළුම් ක්ෂේත්‍රය තුළ සෑම දිනකම උල්ලංඝනය වන්නා වූ මූලික මානව හිමිකම් වන යහපත් වැටුපක් සඳහා වූ අයිතිය පිළිබඳව දැනුවත් කිරීම සඳහා මෙය නිර්මාණය කර ඇත.

මූලික අවශ්‍යතා සපුරාලීම සඳහා එදිනෙදා අරගලයට මුහුණ දෙන ඇඟළුම් සේවිකාවකගේ අභ්‍යන්තර ඒක පුද්ගල කථාවක් මේ හරහා ඔවුන් අපට ඉදිරිපත් කරයි. මෙම චිත්‍රපටය මධ්‍යම, නැගෙනහිර සහ අග්නි දිග යුරෝපයේ CCC ජාලයේ පර්යේෂණ මත පදනම් කරගනිමින් සිදුකර ඇත. මෙහිදී රැස්කරගත් දත්ත අනුව පෙනී යන්නේ මිලියන 1.7 ක් පමණ ඇඟළුම් කම්කරුවන්, ප්‍රධාන වශයෙන් කාන්තාවන්, යුරෝපයේ මෙම කලාප තුළ දරිද්‍රතා වැටුප් මත වැඩ කරමින් ජීවත් වන බවයි. මෙම රටවල ව්‍යවස්ථාපිත අවම ශුද්ධ වැටුප් යුරෝපා සංගමය විසින් නිර්වචනය කර ඇති සංඛ්‍යාමය දරිද්‍රතා රේඛාවලට වඩා අඩු වන බව සඳහන් කරයි. ඔවුන් ප්‍රකාශ කරන පරිදි වසංගතය තුළ පවා ඇඟළුම් සැපයුම් දාමයේ වෙළඳ නාම සහ සිල්ලර වෙළෙන්දන් විසින් උපයා ගන්නා ලාභය අතිමහත්ය.

මෙම චිත්‍රපටයේ ප්‍රධාන අරමුණ වන්නේ යුරෝපීය, අඩු වැටුප් සහිත රටවල විලාසිතා සන්නාමවල ගෝලීය සැපයුම් දාමවල දරිද්‍රතා වැටුප් පිළිබඳව දැනුවත් කිරීම සහ විලාසිතා සන්නාම සහ සිල්ලර වෙළෙන්දන්ට ඔවුන්ගේ සමස්ථ සැපයුම් දාමය සඳහා පොදු, මැනිය හැකි පියවර සැකසීමට මතක් කිරීමයි. එසේම ඇඟළුම් සේවකයින්ට සාධාරණ කාල රාමුවක් තුළ ප්‍රමාණවත් ජීවන වැටුපක් ගෙවීම සහතික කිරීමය.

*උපුටා ගැනීම අන්තර්ජාලය ඇසුරිනි.*

# සුව හා රුව

වර්ථමානය වනවිට අප සමාජය තුල කොවිඩ් වෛරසය පිළිබඳ කථා නොකරන තරමය. කොවිඩ් වෛරසය නිසාම අපට සිදු වූ හානිය මේ වන විට සෑම දෙනාටම අමතකව ගොස් ඇති නමුත් කොවිඩ් වෛරසය තවමත් ලෝකය පුරා මෙන්ම අප රට තුලද පවතී. මේවන විට COVID-Omicron XBB නමින් නව ප්‍රභේදයක් ලෝකය පුරා ව්‍යාප්ත වෙමින් පවතී. මෙම COVID-Omicron XBB කොරෝනා වයිරසයේ නව ප්‍රභේදය වෙනස්, මාරාන්තික සහ නිවැරදිව හඳුනා ගැනීම අපහසු වේ. නව වෛරසය COVID-Omicron XBB හි රෝග ලක්ෂණ පහත දැක්වේ.

1. කැස්ස නොමැත.
2. උණ නොමැත.
3. සන්ධි වේදනාව.
4. හිසරදය.
5. බෙල්ලේ වේදනාව.
6. ඉහළ පිටුපස වේදනාව.
7. නියුමෝනියාව.
8. සාමානයයෙන් ආහාර රුචිය නැත.

COVID-Omicron XBB ඩෙල්ටා ප්‍රභේදයට වඩා 5 ගුණයකින් වැඩි වයිරසයක් වන අතර එයට වඩා ඉහළ මරණ අනුපාතයක් ඇත. තත්වය බරපතල වීම සඳහා අඩු කාලයක් ගත වන අතර සමහර විට පැහැදිලි රෝග ලක්ෂණ නොමැත. මෙම වෛරසය සාපේක්ෂව කෙටි කාලයක් තුළ පෙනහළු වලට සෘජුවම බලපායි. Covid-Omicron XBB රෝග විනිශ්චය කරන ලද රෝගීන් කිහිප දෙනෙකු උණ සහ වේදනා රහිත ලෙස වර්ගීකරණය කර ඇත, නමුත් x-ray මඟින් මෘදු පපුවේ නියුමෝනියාව පෙන්නුම් කරන ලදී.

Covid-Omicron XBB සඳහා නාසල් ස්පුබ් (ශ්වසන ආසාදන ඇති කරන වෛරස් සහ බැක්ටීරියා සඳහා කරන පරීක්ෂණය) පරීක්ෂණ බොහෝ විට සෘණාත්මක වන අතර ව්‍යාජ සෘණ නාසෝෆරින්ජියල් පරීක්ෂණ (ශ්වසන ආසාදන ඇති කරන වෛරස් සහ බැක්ටීරියා සඳහා කරන පරීක්ෂණවලින් එකකි) වැඩි වෙමින් පවතී. මෙයින් අදහස් කරන්නේ වෛරසය ප්‍රජාව තුළ පැතිරී පෙනහළු වලට කෙලින්ම ආසාදනය විය හැකි අතර වෛරස් නියුමෝනියාව ඇති කරන අතර එමඟින් උග්‍ර ශ්වසන අපහසුතාවයක් ඇති විය හැකි බවයි. Covid-Omicron XBB ඉතා බෝවන, අධික වෛරස් හා මාරාන්තික දෙයක් බවට පත්ව ඇත්තේ මන්දැයි මෙයින් පැහැදිලි වේ. ප්‍රවේශම් වන්න, ජනාකීර්ණ ස්ථානවලින් වළකින්න, විවෘත ස්ථානවල පවා මීටර් 1.5 ක දුරක් තබා ගන්න, ද්විත්ව ස්ථර ආවරණයක් පළඳින්න, සුදුසු මුඛ ආවරණයක් පළඳින්න, සෑම කෙනෙකුම රෝග ලක්ෂණ නොමැති වුවද (කැස්සක් හෝ කිවිසුම් යාමක් නැත) නිතර අත් සෝදන්න. මෙම Covid-Omicron XBB තරංගය Covid-19 හි පළමු රැල්ලට වඩා මාරාන්තික වේ. එබැවින් අප ඉතා ප්‍රවේශම් විය යුතු අතර කොරෝනා වයිරසයට එරෙහිව ශක්තිමත් පූර්වාරක්ෂාවන් කිහිපයක් ගත යුතුය.

*උපුටා ගැනීම අන්තර්ජාලය ඇසුරිනි.*

# සීතුවිල්ල

2023 දුරුතු මස ලැබීමත් සමඟ හමන සීතල සුලං රැල්ල තවමත් පවතී. නැගිටින්න කම්මැලිය. තව ටිකක් රෙද්ද පොරවා ගෙන වකුටු වී නිදියන්න ඇත්නම්. ගමේ නම් කුස්සියට ගොස් ලිප ළඟ ඇඟ තියාගෙන ගිනි තපින්න තිබුනා. බෝඩිමේ එහෙම නැනේ. කෝකටත් තෙයිලය කියලා උයන්න පිහන්න අඳින්න පළඳින්න නිදියන්න සේරටම තියෙන්නේ අඩි අටේ කාමරයක්නේ.

තවත් ගුලි වී සිහින ලෝකයට යා නොහැක. රතු කට්ට වදින්න පෙර කම්හල වෙත යා යුතුය. රතු කට්ට පනින්න ඉස්සරලා කම්හල තුළට රිංගුවේ නැත්නම් ඒකත් කටින් වෙනවා. රට තුල පවතින ආරංචි අනුව අපේ කම්හලත් කොයි වෙලේ වහයිද මන්දා. එහෙම වුනොත් මලා තමයි. රට තුළ පිහිටි විවිධ ක්ෂේත්‍ර තුල පිහිටි ආයතන, කම්හල් වැසී ගෙන යමින් පවතී. අපගේ වැටුප්වල බිංදු ගානද මේ දිනවල කැපිලා. නමුත් බිත්තර මිල නම් ඉහළ ගිහින්. එච්චරයි අඩු මිලකට කන්න තිබුන දේ. පාලන මිලක් නොමැති නිසා වෙළඳුන් හිතුමතේ මුදල් ගරා ගන්නවා.

පොහොර ප්‍රශ්නය නිසා ගොවියා අතරමං වෙලා. ගොවි තැනට වුනු වින්නැහියක්. කෘෂි කර්මාන්තය බිඳ වැටී ඇත. විවිධ දේශපාලන පක්ෂ භේද බින්න වෙලා රටේ පවතින ආර්ථික අර්බුධය තුළ විදෙස් රැකියාවේ ප්‍රවණතාවය වැඩි වී ඇත. මිනිස් ජාවාරමද ඉහළ ගොස් ඇති අතර මත් ද්‍රව්‍ය උවදුර වැඩි වී මිනිස් ඝාතනද දිනපතා අසන්නට ලැබේ. අත්‍යවශ්‍ය භාණ්ඩ මිල ඉහල යාම හේතුවෙන් මිනිසුන් හොරමැර කම්වලට පුරුදු වෙලා. මිනිස්කම දුරස් වෙලා ගිහින් ආත්මාර්ථකාමීත්වයෙන් පිරිලා අරගලද නිමක් නැහැ.

සිතුවිලි අතරේ සිරවී සිටින අපි කුමක් කරන්නද? අපගේ රැකියාව හඹක් වී ඇත.

සමන්තා

# ප්‍රහේලිකා අංක - 39

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 කැ | | 2 | | 3 | |
| | ■ | | ■ | | ■ |
| | ■ | 4 | | න් | 5 |
| 6 | 7 ට | | ■ | 8 | |
| ■ | | ■ | 9 | | ■ |
| 10 | | ■ | 11 | | |

**හරහට**

1. රටේ නිදහස වෙනුවෙන් දිවිපිදූ වීරවරයෙකි.
4. සාතු හතරෙන් එකකි.
6. නිදහස් යන්නේ විරුද්ධ අර්ථය
8. අයිතිවීම යන්නට සමානය.
9. සෞරග්‍රහ මණ්ඩලයේ ප්‍රධානියා
10. බෞද්ධ දර්ශනයේ කියවෙන තුන් දොරින් එකකි.
11. ගීත ඇසීමෙන් පිනවන ඉන්ද්‍රියයි.

**පහළට**

1. බුදුන් වහන්සේ තෙවන වරට ලංකායට වැඩි ස්ථානය.
2. සිල් සමාදන් වීම යන්නට සමාන පදයකි.
3. ලක්දිව පැරණි රාජධානිවලින් එකකි.
5. තොරතුරු යන්නට සමාන පදයකි
7. කුඩා පක්ෂින්ගෙන් හා කුඩා සතුන්ගෙන් එලවැල රැක ගැනීම සඳහා ගම්බද භාවිතා කරන උපකරණයකි.
9. ඔළුව යන්නට සමාන පදයකි.

මෙම ප්‍රහේලිකාව නිවැරදිව පුරවා මෙම ලිපිනයට එවා තෑගි දිනන්න.

ඩාබිඳු සාමුහිකය
221, වෙළබඩ පාර, කටුනායක.




# ජාත්‍යන්තර අධ්‍යාපන දිනය

අධ්‍යාපනය මානව අයිතිවාසිකමක්, පොදු යහපතක් සහ පොදු වගකීමකි. එම නිසාම ගෝලීය සාමය සහ තිරසාර සංවර්ධනය සඳහා අධ්‍යාපනයේ කාර්යභාරය සැමරීම වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය ජනවාරි 24 ජාත්‍යන්තර අධ්‍යාපන දිනය ලෙස ප්‍රකාශයට පත් කරන ලදි. 2018 වසරේ දෙසැම්බර් සිට මෙම දිනය ප්‍රකාශයට පත් කරන ලද අතර එය මෙවර සමරනු ලබන්නේ "මිනිසුන් සඳහා ආයෝජනය කිරීම, අධ්‍යාපනයට ප්‍රමුඛත්වය දීම" යන තේමාව යටතේ ය.

අධ්‍යාපනය යනු මානව අයිතිවාසිකමක් වන අතර වර්ථමානයේ දී එය අවාසනාවන්ත ලෙස ලොව පුරා උල්ලංඝනය වෙමින් පවතී. UNESCO හි සංඛ්‍යාලේඛන දත්ත වලට අනුව, ඇස්තමේන්තුගත ළමුන් මිලියන 258 ක් පාසල් නොයන බව වාර්ථා වේ. දරුවෙකු පාසල් නොයෑමට එක් ප්‍රධාන හේතුවක් වන්නේ සම අයිතිවාසිකම් ප්‍රශ්නයයි. මෙම අසමානතාවයන්ට ස්ත්‍රී පුරුෂ භාවය, සෞඛ්‍යය සහ සංස්කෘතික අනන්‍යතා ඇතුළත් වේ. එසේම පාසල් යෑම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීමට ඇති නොහැකියාව, මූල්‍ය හිඟය, ගුරුවරුන්ගේ හිඟය ආදී කරුණුද බලපානු ලබයි.

නෙල්සන් මැන්ඩෙලා මහතා ප්‍රකාශ කරන පරිදි ලෝකය වෙනස් කිරීමට ඔබට භාවිතා කල හැකි බලවත්ම ආයුධය අධ්‍යාපනයයි. ලෝකය පමණක් නොව ඔබට ඔබව වෙනස් කර ගැනීමට ද අවශ්‍ය වන්නේ අධ්‍යාපනයයි. දුප්පත්කමෙන් මිදීමට ඔබ මිදීමට අවශ්‍යයි නම් කල යුත්තේ ඔබ නිසි අධ්‍යාපනයෙන් සවිබල වීමයි. මෙහිදී විශ්ව විද්‍යාලය දක්වා අධ්‍යාපනය හැදෑරීම සහ ඉන් ඔබ්බට යෑම පමණක් මින් අදහස් නොවේ. නිදහස් අධ්‍යාපනය පවතින ලංකාව තුළ අධ්‍යාපනය ලබා ගැනීමට වෙනත් ක්‍රම රාශියක් පවතී. ශ්‍රී ලංකාවේ ජාතික වෘත්තීය සුදුසුකම් පද්ධති (NVQSL) පළමු මට්ටමේ සිට හත් වන මට්ටම දක්වා ව්‍යුහගත සුදුසුකම් හතක් සපයයි. ශ්‍රී ලංකාවේ විවෘත විශ්ව විද්‍යාලයේ සහ වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලයේ උපාධි මට්ටම සඳහා වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව සිදු කරනු ලැබේ. කාර්මික විද්‍යාල 37 ක, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය සහ ශ්‍රී ලංකා කෘෂිකර්ම පාසල ආදිය හරහා ඩිප්ලෝමා මට්ටමින් අධ්‍යාපනය සහ පුහුණුව ලබා දීම සිදු කරනු ලැබේ. මේ ආකාරයට විවිධ ක්‍රම ඔස්සේ ලබාගත හැකි නිදහස් අධ්‍යාපනය හරහා ඔබටත් ඔබගේ ජීවිතය වෙනස් කරගත හැකිය.

මධුමාලි සිරිවර්ධන

කම්කරු පුවත්

# කඩා වැටෙන ආර්ථිකය හමුවේ අර්බුධයට පත් ඇඟළුම් සේවිකාවෝ

වර්ථමානයේ දැඩි ආර්ථික අර්බුධයට මුහුණ පාන කම්කරුවන් මේ ඔවුන්ගේ නරකම බියකරු සිහිනවලට මුහුණ දී සිටිති. විශේෂයෙන් ඇඟළුම් කර්මාන්තයේ විශාල පසුබෑමකට මුහුණ දී සිටින සේවකයින්ට කිසිදු දීමනාවක් සහ සීමිත වැඩ දිනයක් නොමැතිව සේවයෙන් ඉවත් වීමට සිදු වේ. මේ වන විට දත්ත මඟින් අනාවරණය වන්නේ කර්මාන්තය කලින් වාර්තා කළ පහත වැටීම් වලට අමතරව තවත් සියයට 25 ක පහත වැටීමකට මුහුණ දීමට ඉඩ ඇති බවයි. කුඩා පරිමාණයේ ඇඟළුම්හල් පමණක් නොව මධ්‍යම පරිමානයේ මෙන්ම විශාල පරිමානයේ කම්හල්ද මේ වන විට ඔවුන්ගේ සේවකයන්ට දින, සති, මාස ගණන් නිවාඩු දීම හේතුවෙන් ඇඟළුම් සේවිකාව කබලෙන් ලිපට වැටී ඇත.

එසේම වසර දෙකක පමණ සිට වැටුප් වර්ධනයක් නොවීම, ප්‍රසාද දීමනාවක් නොලැබීම, අතිකාල දීමනාවක් නොලැබීම, අවම වශයෙන් මූලික වැටුපවත් නොලැබීම ආදී කරුණුද ඔවුන්ව මෙසේ අර්බුධයට පත් වීමට හේතු වී ඇත. මෙම අර්බුධ හමුවේ ඔවුනට සිදුවන අසාධාරණකම් ඉදිරිපත් කිරීමට වෘත්තීය සමිති නිර්මාණය කිරීමකදී හෝ සම්බන්ධ වීමකදී ඔවුන්ව රැකියාවෙන් නෙරපා හැරීම සිදු කරනු ලබයි. ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා ඇති පරිදි 14 (1) වගන්තිය මඟින් සංගමයේ නිදහස, කථා කිරීමේ නිදහස, රැස්වීමේ සහ ඒකරාශී වීමේ අයිතිය මෙන්ම 14 (1) ඩී වගන්තිය මඟින් වෘත්තීය සමිති සෑදීමට සහ ඒවාට බැඳීමට ඇති අයිතිය තහවුරු කර ඇත. එසේනම් සේවකයන් වෘත්තීය සමිතියක් නිර්මාණය කිරීමකදී හෝ සම්බන්ධවීමකදී ඔවුන්ව රැකියාවෙන් නෙරපා හැරීම සිදුකළ හැකිද?



අංකඃ 221, වෙළබඩ පාර, කටුනායක හි පදිංචි එච්. අයි. සමන්මලී වන මා විසින් මීගමුව රන්වැකි මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදි.